# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2008/32 - 2017 මාර්තු මස 03 වැනි සිකුරාදා - 2017.03.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක : IR/15/12/2012

### කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2014.04.17 දිනැති හා අංක 1858/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2014.04.01 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බත්තරමුල්ල, තලංගම උතුර, රිචඩ් ද සොයිසා මාධ්‍ය නිවාස, නො. 30 හි පදිංචි පද්මා වෙරගොඩ ආරච්චි මිය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ, ලේක්හවුස් මන්දිරය, තැ.පෙ. 248 හි පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2016.12.05 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2017 පෙබරවාරි මස 21 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංක : IR/15/12/2012

### කාර්මික අධිකරණයේ දී ය.

පද්මා වෙරගොඩ ආරච්චි මිය,
නො. 30,
රිචඩ් ද සොයිසා මාධ්‍ය නිවාස,
තලංගම උතුර, බත්තරමුල්ල.

ඉල්ලුම්කරු

නඩු අංකය : ඒ 3545

සහ

ලංකාවේ සීමාසහිත එක්සත්
ප්‍රවෘත්ති පත්‍ර සමාගම,
තැ. පෙ. 248, ලේක් හවුස් මන්දිරය
කොළඹ.

වග උත්තරකරු

### ප්‍රදානය

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව ඉහත සඳහන් පාර්ශ්වකරුවන් අතර ඇති කාර්මික ආරවුල බේරුම් කිරීම මගින් නිරවුල් කිරීම පිණිස 2014.04.01 දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී ඇත්තේ ''ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ කළමනාකරණ කතුවරියක් ලෙස සේවය කරන ලද පද්මා වෙරගොඩ ආරච්චි මහත්මියට 2008, 2009, 2010, 2011 යන වර්ෂයන් සඳහා වැටුප් වර්ධක ලබා නොදීමෙන් ඇයට යම් අසාධාරණයක් සිදු වී තිබේද ? එසේ සිදු වී ඇත්තේ ඇයට ලබා දිය යුතු සහනයන් කවරේද '' යන්න පිළිබඳව වේ.

දෙපාර්ශ්වය විසින් ඔවුනොවුන්ගේ ප්‍රකාශ ඉදිරිපත් කර හුවමාරු කර ගැනීමෙන් පසුව ඉල්ලුම්කාරිය වෙනුවෙන් පුණ්‍යා ජයතිලක මහත්මිය පෙනී සිටි අතර වගඋත්තරකාර සමාගම වෙනුවෙන් මුල් අවස්ථාවල නියෝජිත වනිගසේකර මහතා සමග නීති නිලධාරිනී සුදර්ශනී හේවාවසම් මහත්මියත් සහ නීතිඥ ඉන්දික පෙරේරා මහතාත් පෙනී සිටින ලදී. විභාගය අවසානයේ සමථයකට සාකච්ඡා කරන විට ආයතනය වෙනුවෙන් බාලචන්ද්‍ර මහත්මියත් නීතිඥ සුදර්ශනී හේවාවසම් මහත්මිය සමග ප්‍රධාන නීති නිලධාරිනී ආර්. එම්. තේනුවර මහත්මියත් පෙනී සිටින ලදී.

2014.11.26 වන දින නඩු විභාගයේ දී කම්කරු කොමසාරිස් කාර්යාලයේ IR/15/12/2012 නැමැති නඩුවේ කම්කරු කොමසාරිස්තුමා විසින් දෙන ලද නියෝගයට වගඋත්තරකාර සමාගම මෙතෙක් පිළිතුරක් දී නොමැති බැවින් ඉදිරියේදී හෝ ඒ පිළිබඳව ක්‍රියා කරන්නේ නම් අද දින නඩුව තාවකාලිකව නැවැත්වීමට හැකි බව දන් වූ විට වගඋත්තරකාර සමාගමට A - 14 ලෙස ලකුණු කළ ලේඛනය ලැබී නොමැති නිසා අද දින පැමිණිලිකාරියගෙන් පිටපතක් ලබාගෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිචාර සඳහා ඉදිරිපත් කරන බව වගඋත්තරකාර සමාගම වෙනුවෙන් කියා සිටින ලදී.

2015.04.02 වන දින ඉල්ලුම්කාරිය ද කියා සිටියේ නව අධ්‍යක්ෂ මණ්ඩලය වගඋත්තරකාර සමාගමේ නව සභාපතිවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමෙන් පසු නීති අධ්‍යක්ෂ වෙත ගොනුව යොමු කර ඇති බව දැන ගැනීමට ඇති බවත් ය. 2015.07.07 වන දින වගඋත්තරකාර සමාගම ඉල්ලුම්කාරියට ගෙවීමට ඇති මුදල පිළිබඳ දන්වන ලද අතර ඒ පිළිබඳව ඉල්ලුම්කාරිය කියා සිටියේ ගෙවීමට සකස් කර ඇති ගිණුම් ප්‍රකාශය පරීක්ෂා කර බලා ආයතනයට හැඳුණුම්පත්, ජංගම දුරකථනය යලි ලබා දීමටත් ඉල්ලුම්කාරිය සතු ලේඛන වගඋත්තරකාර ආයතනය වෙත ඉදිරිපත් කිරීමටත් ප්‍රමාණවත් කාලයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

වගඋත්තරකාර පාර්ශ්වය සමථය සම්බන්ධව තම නීති අංශයෙන් තීරණයක් ගැනීමට දින කිහිපයක් ලබා ගත් පසු 2015.10.02 දින 2008, 2009, 2010, 2011 යන වර්ෂයන් සඳහා වාර්ෂික වැටුප් වර්ධකවලට අදාළ හිඟ වැටුප් වර්ධක, ප්‍රසාද දීමනා සේවා නියුක්තියන්ගේ භාර අරමුදලේ හිඟ භාර අරමුදල්, හිඟ පාරිතෝෂික දීමනා ඇතුළු සියලු දීමනා සම්බන්ධයෙන් පූර්ණ හා අවසාන සමථයක් ලෙස 2015.09.03 දිනැති අංක 083233 දරන ලංකා බැංකු චෙක්පත මගින් රු.356881.70 ක මුදල (චෙක්පත) ඉල්ලුම්කාර පාර්ශ්වයට ලබා දීමෙන් පසු අවසාන සමථයක් ලෙස පැමිණිලිකාරිය වාර්ෂික හිඟ වැටුප් සම්බන්ධව වෙනත් කිසිදු දීමනාවක් වගඋත්තරකාර සමාගමෙන් නොඉල්ලන බවට එකඟ වී නඩු ගොනුවේ අත්සන් තබමින් අවසාන ගිණුම ප්‍රකාරව ඉල්ලුම්කාරියගෙන් අය විය යුතු ව ඇති 51357.80 ක මුදල ඉල්ලුම්කාරිය නමින් ආයතනයේ සේවක අර්ථසාධක අරමුදලේ ඇති මුදලින් අඩු කර ගැනිම පිළිබඳව ඉල්ලුම්කාරියගේ විරෝධතාවයක් නොමැතිව බවටත් ප්‍රකාශ කිරීමෙන් පසු 2015.08.25 දින කාර්යසටහනේ ඇති ඉල්ලුම්කාරියගේ අත්සන ලබාගෙන ඉල්ලුම්කාරියට චෙක්පත භාර දෙන ලදී. නඩුවෙන් ඉල්ලුම්කාරිය විසින් සිදු කළ ඉල්ලීම මේ වන විට ලබා දී අවසාන බැවින් නඩුවේ කටයුතු අවසන් බව ප්‍රකාශ කරමි.

ආර්. එස්. ආරියප්පෙරුම,
බේරුම්කරු.

2016 දෙසැම්බර් මස 05 වැනි දින.

03 - 860

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.